ආහාර බෝග වගාව

# පිෂ්ඨය සපයන අල බෝග

අල වර්ග එදිනෙද පරිභෝජනයට බහුලව යොද ගනී. ඒ ඒ පුද්ගලයාගේ රුචි අරුචිකම් අනුව විවිධාකාරවූ අල වර්ග ආහාරයට ගැනීමට පුරුදුව සිටී. අල පිෂ්ඨමය ආහාරයක් නිසා පහසුවෙන් දිරවීමේ ගුණයෙන්ද යුක්තය. මේ නිසා ආහාරයට එක්කර ගැනීමේදී වැඩි රුචිකත්වයක් ඊට හිමිය.

## අර්තාපල්

නව බෝගයක් වශයෙන් 1960 දශකයේදී කඳුකර ප්‍රදේශයට මෙම බෝගය හඳුන්වා දෙන ලදී. එකල පොහොර ආදිය ද ලබා දෙමින් අල වගාව සඳහා පුද්ගලයන් ධෛර්යමත් කිරීමට වගකිවයුත්තෝ එද කටයුතු කළහ.

ප්‍රදේශයේ පාසල් අතහැර ගිය අය මෙන්ම, වෙනත් ප්‍රදේශවලින් පැමිණි අයද නව වගාවට සම්බන්ධවී ව්‍යාපාරිකයෝ බවට පත් වූහ.

නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික අල වගාව සඳහා ප්‍රධාන තැනක් උසුලයි.

එනම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ මස්කෙලිය, වලපනේ, කොත්මලේ, හඟුරන්කෙත ආදී ප්‍රදේශ ද බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇල, බණ්ඩාරවෙල, හපුතලේ, වැලිමඩ ඌවපරණගම ආදී ප්‍රදේශ ද මෙහිලා ප්‍රධානත්වයක් ගනී.

සමස්ත වගාවෙන් 90% ක් ඉහත දිස්ත්‍රික්කවලට අයත් අතර 10% ක් පමණක් සෙසු දිස්ත්‍රික්කවල සිදු කෙරේ. අතහැර දමා තිබූ තේ, පෙයාර්ස් වගා බිම් ද පසුකාලීනව අර්තාපල් වගාව සඳහා යොද ගැනිණි.

දකුණු ඇමෙරිකාවේ පේරු හා බොලිවියා හි සම්භවයක් ඇති අර්තාපල් බෝගය "සොලනේසි" කුලයට අයත්ය. ප්‍රෝටීන හා අත්‍යවශ්‍ය විටමින් ඛනිජ අඩංගු පෝෂණීය ආහාරයකි.

**නිර්දේශිත ප්‍රභේද –**

(1) ඩිසයිරි
(2) කොන්ඩොර්
(3) කාඩිනල්
(4) සීතා

මාස 3 ත් 3 1/2 ත් කාලයකදී අස්වනු නෙලා ගත හැක. උඩරට තෙත් සහ අන්තර් මධ්‍ය කලාපවල, යල සහ මහ කන්න දෙකේදීම වගා කළ හැකිය. වගාව සඳහා රෝග හා පළිබෝධයන්ගෙන් තොර ගුණාත්මකද නිරෝගී බීජ තෝරා ගත යුතු අතර ප්‍රශස්ත ප්‍රමාණයේ (මි. මී. 28–45) බීජ යොද ගත යුතුවෙයි. නියමිත ප්‍රමාණයේ අමිශ්‍ර පොහොර යෙදීම, හොඳින් දිරාපත්වූ කාබනික පොහොර අර්තාපල් බීජ සිටුවන අවස්ථාවේදීම පසට කලවම් කිරීම වගාවේ සාර්ථකත්වයට බලපායි.

> **දකුණු ඇමෙරිකාවේ පේරු හා බොලිවියා සම්භවයක් ඇති අර්තාපල් බෝගය "සොලනේසි" කුලයට අයත්ය. ප්‍රෝටීන හා අත්‍යවශ්‍ය විටමින් ඛනිජ අඩංගු පෝෂණීය ආහාරයකි.**

හොඳින් ජලය බැස යන පී. එච්. අගය 5.2–6.5 ක් වූ බුරුල් පස යෝග්‍යය. පසෙහි පී. එච්. අගය 5.2 ට අඩුනම් හුණු හෝ ඩොලමයිට් හෝ යොද පී. එච්. අගය යෝග්‍ය මට්ටමකට පත් කර ගත යුතුය.

නුවරඑළිය, බදුල්ල හා යාපනය දිස්ත්‍රික්කවල ලැටසෝල් පසේ වගාව සඳහා මූලික පොහොර ලෙස හෙක්ටයාරයකට යූරියා කිලෝ ග්‍රෑම් 165 ක්ද, ත්‍රිත්ව සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 280 ක්ද, මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 125 ක්ද යෙදිය යුතු අතර පස් මුදුන් කිරීමේදී යූරියා හා මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 125 ක් බැගින් යෙදිය යුතුයි.

බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹුරු බිම් සඳහා මූලික පොහොර ලෙස යූරියා 165 ක්ද, ත්‍රිත්ව සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 280 ක්ද, මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 85 ක්ද, පස් මුදුන් කිරීමේදී යූරියා කිලෝ ග්‍රෑම් 165 ක්ද මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 85 ක්ද යෙදීම වැදගත්.

කල්පිටිය ප්‍රදේශයේ රෙගොසෝල් පසේ වගාව සඳහා මූලික පොහොර ලෙස යූරියා කිලෝ ග්‍රෑම් 65 ක්ද, ත්‍රිත්ව සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 280 ක්ද, මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 50 ක්ද යෙදිය යුතු අතර



සති 2,4,6 හා 8 දී යූරියා කිලෝ ග්‍රෑම් 65 ක්ද මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 50 ක්ද යෙදිය යුතුවේ.

**වගාවට වැළඳෙන දිලීර රෝග**

(1) පශ්චිම අංගමාරය
(2) පූර්ව අංගමාරය
(3) රිදීපටල රෝගය
(4) බැක්ටීරියා හිටුමැරීම
(5) කළුපාද රෝගය
(6) පියලි කුණුවීම

**වගාවට බලපාන වෛරස් රෝග**

(1) අර්තාපල් පත්‍ර රෝල්වීමේ වෛරස් රෝගය (PLRV)
(2) අර්තාපල් වෛරස් Y (PVY)
(3) අර්තාපල් වෛරස් X (PVX)
(4) අර්තාපල් වෛරස් S (PVS)

**වගාවට හානිකරන කෘමීන්**

(1) කියත් පනුවා
(2) කුඩිත්තා
(3) පත්‍ර කණීත්තා
(4) රත්වත් කෝෂ්ඨ වට පණුවා
(5) අල ඉපියා

නිවැරදි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කොට අක්කරයක වගාවෙන් ටොන් 8–10 ත් අතර අස්වැන්නක් ලබා ගත හැකිය.

## කිරි අල

ගෙවතු හා තෙත් කලාපයේ සම්ප්‍රදායික බෝගයක් වන කිරි අල දෙහිය, ඕවිටිවල, පොල් හා කෙසෙල් වගා අතර අතුරු බෝගයක් ලෙසද වගා කළ හැකියි. වියළි කලාපයේ කුඹුරු බිම්වල ජල සම්පාදනයෙන් සිදුවන වගාවක් ලෙස කිරි අල පෙන්වා දිය හැකියි. නිසරු පසෙහි වුවද කාබනික ද්‍රව්‍ය යොද වගාව සඳහා භාවිතයට ගැනේ.

අපනයන බෝගයක් නිසා සැලකිය යුතු විදේශ විනිමයක් උපදවා ගත හැකි බෝග විශේෂයකි. කන්න බෝගයක් නොවන නිසා වසරේ ඕනෑම කාලයක ජල පහසුකම් සහිත ඉඩම්වල වගා කළහැකිය.

**කිරි අල වර්ග කිහිපයකි.**

(1) රතු ඉරි කිරි අල
(2) කහ කිරි අල
(3) අඩ දම් කිරි අල
(4) කළු කිරි අල
(5) දම් කිරි අල

**ගෙවතු හා තෙත් කලාපයේ සම්ප්‍රදායික බෝගයක් වන කිරි අල දෙනිය, ඕවිටිවල, පොල් හා කෙසෙල් වගා අතර අතුරු බෝගයක් ලෙසද වගා කළ හැකියි. නිසරු පසෙහි වුවද කාබනික ද්‍රව්‍ය යොදා වගාව සඳහා භාවිතයට ගැනේ.**



කිරි අල

නිර්දේශිත ප්‍රභේද

ඉසුරු

ඕනෑම වගා ක්‍රමයකට අනුවර්තනය කළහැකි මාස 8–10 අතරදී වැඩි අස්වැන්නක් ලබා දෙයි. අඩු අවධානයක් යටතේ සාර්ථකව වගා කළ හැකිය. ලෙඩ රෝග සෑදීම ද ඉතා අවම මට්ටමක පවතියි.

තනි වගාවක් ලෙස වගා කිරීමේදී මීටර 1*1 ත් ලෙසට ද අතුරුවගාවක් ලෙස වගා කිරීමේදී මීටර 1.2*1.2 ලෙසට ද වරතරයක් ඇතිව වගා කළ හැකියි. කාබනික පොහොරවලට අමතරව රසායනික පොහොර යෙදීමෙන් වැඩි අස්වනු ලැබීමට දායක වෙයි. පැල සිටුවීමට පෙර හෙක්ටයාරයකට යූරියා කිලෝ ග්‍රෑම් 30 ක්ද, ත්‍රිත්ව සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 120 ක්ද මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 60 ක්ද යෙදීම වැදගත්ය. එසේම මාස 1;2;3;4 දී යූරියා කිලෝ ග්‍රෑම් 30 බැගින්ද මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 30 බැගින්ද යෙදිය යුතු වේ.

අල බෝගයේ පත්‍රවලින් පොලොව ආවරණය වනතෙක් බෝගය පිළිබඳ අවධානයෙන් සිටිය යුතුය. පොහොර යොදන විට හා වල් මර්දනය කරන විටදී පැලය අසලටම පස් දමා පිරවිය යුතුය.

දරුණු කෘමි හා රෝග හානි කලාතුරකින් ඇතිවන නමුදු වගාබිමෙන් ජලය බැස යාම දුර්වල වූ විට සහ පසෙහි මැටි ස්වභාවය අධික වූ විට මුල් කුණුවීමේ රෝගය හටගනියි. හොඳින් නඩත්තු කළ වගාවක හෙක්ටයාරයකින් මෙට්‍රික් ටොන් 16–18 ත් අතර අස්වැන්නක් ලබා ගත හැකියි.

## බතල

ගෙවතු, ඕවිටි, හේන්වල මිශ්‍ර බෝගයක් ලෙස ද පුරන් කුඹුරුවල ද විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ වගා කළ හැකියි.

කන්න බෝගයක් නොවීම, පහසු නඩත්තුව, අහිතකර පාරිසරික තත්ත්වයන්ට හැඩ ගැනීම, අවම යෙදුම්, අඩු පලිබෝධ භාවිතාව, හා කෙටි කාලීන අස්වනු ලැබීම, වගාවේදී ඇති සුවිශේෂී ගුණයන් වේ. බෝගය වගා කරන කාලයේදී වර්ෂාව හිතකර වුවද අල හටගන්නා විටදී වියළි දේශගුණය අත්‍යවශ්‍ය සාධකයකි.

නිර්දේශිත ප්‍රභේද

(1) CARI - 9
(2) CARL - 275
(3) CARI - 426
(4) වාරියපොල – සුදු
(5) වාරියපොල – රතු
(6) රණබිම
(7) BW-8 (ශාන්ති)
(8) BW – 21 (චිත්‍රා)

හොඳින් ජලය බැස යන වැලි ලෝම් පස වගාවට යෝග්‍යය. තද මැටි සහිත පසෙහි වගා කිරීමේදී එළදාව හීනය.

මූලික පොහොර ලෙස හෙක්ටයාරයකට යූරියා කිලෝ ග්‍රෑම් 60 ත්, සාන්ද්‍ර සුපර් පොස්පේට් හා මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 120 බැගින් යෙදිය යුතුය. මතුපිට පොහොර සඳහා යූරියා හා මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 60 බැගින් යෙදීම වැදගත්ය.

පාංශු ඛාදනය, හා මනා ජල වහනය, වගාවේ සාර්ථකත්වයට බලපාන බැවින් උසස් පාත්ති සැකසීම අත්‍යවශ්‍යය. මේ සඳහා පාරිසරික කරුණු කෙරෙහි අවධානයෙන් සිටිය යුතුයි. වර්ෂා ජලයත් සමග යල හා මහ කන්නයේදී තෙත් කලාපයෙහි වගා කළද වියළි කලාපයෙහි මහ කන්නයේ පමණක් වගා කෙරේ. සිටුවීමේදී සෑමවිටම පැල දෙකක් අතර පරතරය අඟල් 9 ක් විය යුතුය.

වර්ධක වර්ධනය උපරිම කරගැනීම සඳහා දින 45 කට පෙර පොහොර යෙදිය යුතුය. අනතුරුව වර්ධනය අවම කරමින් අල වර්ධනය උපරිම කිරීමට කටයුතු කිරීම වැදගත්ය.

**කන්න බෝගයක් නොවීම, පහසු නඩත්තුව, අහිතකර පාරිසරික තත්ත්වයන්ට හැඩ ගැනීම, අවම යෙදුම්, අඩු පලිබෝධ භාවිතාව, හා කෙටි කාලීන අස්වනු ලැබීම, වගාවේදී ඇති සුවිශේෂී ගුණයන් වේ.**




බතල

වගාවට හානිකරන කෘමි රෝග

(1) බතල ගුල්ලා
(2) විනිවිද පියාපත් සලබයා (වැල් විදින්නා)
(3) පත්‍ර කහ දළඹුවන් හා කුරුමිණියන්
(4) වටපණු රෝගය

ඒ ඒ ප්‍රභේද මැනවින් වගා කිරීම මඟින් අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 16 ත් 25 ත් අතර ලබා ගත හැකියි.

| ප්‍රභේදය | අස්වැන්න මෙට්‍රික් ටොන් |
|---|---|
| 1. CARI - 9 | 16–18 |
| 2. CARI - 273 | 18–20 |
| 3. CARI - 426 | 22–24 |
| 4. වාරියපොල – සුදු | 22–25 |
| 5. වාරියපොල – රතු | 14–15 |
| 6. රණබිම | 22–25 |
| 7. BW8 – ශාන්ති | 12–14 |
| 8. BW21 – චිත්‍රා | 12–14 |

සිටුවා මාස 3 1/2 ත් 4 ත් අතර කාලයේදී අස්වනු නෙලා ගත හැකිය. ලබන කලාපයේන්ද අල බෝග පිළිබඳ බලාපොරොත්තු වන්න.

සටහන
සමන්ත මල්ලවආරච්චි
තිළිණ රුවන් මලලසේකර
ඡායාරූප - සංජීව කැල්ලපත